සියළුම අංශවලට අයත් දිගු කාලීන හා මධ්‍ය කාලීන මුළු ණය ප්‍රමාණය 1983 දී රුපියල් 5,689 කෝටි 20 ලක්ෂයේ (විගැහි 217 කෝටි 40 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 6,464 කෝටි 90 ලක්ෂය (විගැහි 251 කෝටිය) දක්වා වැඩි විය. මෙම ණය ප්‍රමාණය 1984 අවසානය වන විට නොගෙවා ඉතිරිව ඇති මුළු විදේශ ණය වලින් සියයට 87 ක් වූ අතර 1983 දී සියයට 83 ක් විය.

1984 වර්ෂයේ විදේශ ණය සංයුතියේ දක්නට ලැබුණ වැදගත් ලක්ෂණයක් වනුයේ කෙටි කාලීන හා අනිකුත් ණය යන අංශයේ ඇති වූ සැළකිය යුතු (සියයට 14 ක) අඩුවීමයි. මෙම අඩුවීම, ප්‍රධාන වශයෙන් දක්නට ලැබුනේ 1983 දී රුපියල් 187 කෝටි 30 ලක්ෂයේ (විගැහි හත්කෝටි 20 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් එක්කෝටි 30 ලක්ෂය (විගැහි පන්ලක්ෂය) දක්වා අඩු වූ, මහ බැංකුවේ කෙටි කාලීන ණය ගැනීම් අංශයේ ය. නොගෙවා ඉතිරිව ඇති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හැර ගැණුම් ප්‍රමාණයද 1983 දී විගැහි 19 කෝටි 60 ලක්ෂයේ සිට විගැහි 19 කෝටි 20 ලක්ෂය දක්වා අඩු විය. නමුත් ප්‍රධාන වශයෙන් මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යවසායයන් හා අනිකුත් ව්‍යවසායයන් විසින් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් වැඩි වශයෙන් ණය ගැනීම නිසා ' අනිකුත් ණය ' වැඩි වී ඇත.

**ණය සේවා ගෙවීම්**

දිගුකාලීන සහ මධ්‍යකාලීන ණය ආපසු ගෙවීම් හා සියලුම විදේශ ණය වෙනුවෙන් වූ පොළී ගෙවීම් වලින් සමන්විත වන ණය සේවා ගෙවීම් 1983 දී රුපියල් 713 කෝටි 60 ලක්ෂයේ (විගැහි 28 කෝටි 70 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 792 කෝටි 30 ලක්ෂය (විගැහි 28 කෝටි 70 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 792 කෝටි 30 ලක්ෂය (විගැහි 30 කෝටි 40 ලක්ෂය) දක්වා වැඩි විය. මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යවසායයන් සහ අනිකුත් ආයතන ලබාගත් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය සඳහා ආපසු ගෙවීම් ඉහත සංඛ්‍යා-වන්ට ඇතුළත්ව නැත. කෙසේ වෙතත් මෙම ණය සඳහා ගෙවන ලද පොළී මුදල් ඇතුළත් කොට ඇත. වර්ෂය තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ගැනීම් සහ පොළී හා සේවා ගෙවීම් පිළිවෙලින් රුපියල් 59 කෝටි 30 ලක්ෂයක් (විගැහි දෙකෝටි 30 ලක්ෂයක්) සහ රුපියල් 81 කෝටි 90 ලක්ෂයක් (විගැහි තුන්කෝටි දශ ලක්ෂයක්) විය. පසුගිය වසරේ මේවාට සම සංඛ්‍යා පිළිවෙලින් රුපියල් 109 කෝටි 70 ලක්ෂයක් (විගැහි හාර කෝටි 60 ලක්ෂයක්) හා රුපියල් 74 කෝටි 90 ලක්ෂයක් (විගැහි තුන්කෝටි 10 ලක්ෂයක්) විය. ණය සේවා ගෙවීම්වල මුළු ප්‍රමාණය භාණ්ඩ අපනයනයෙන් සහ සේවාවන්ගෙන් ලත් මුළු ඉපයීම් වල ප්‍රතිශතයක් ලෙස ගත් කල විගැහි වටිනාකම අනුව 1983 දී සියයට 21.9 සිට 1984 දී සියයට 17.2 දක්වා පහත වැටිණ. අපනයන ඉපැයීම් ඉහළ යාම මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගණුදෙනු අත්හල විට ණය සේවා අනුපාතය 1983 දී සියයට 16.0 සිට 1984 දී සියයට 14.1 දක්වා පහත වැටිණ. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම යනාදියෙන් වූ ලැබීම් වල ප්‍රතිශතයක් ලෙස, සමස්ත ණය සේවා ගෙවීම් 1983 හා 1984 වර්ෂ දෙක තුළදී සියයට 18.1 සිට සියයට 14.7 දක්වා අඩු විය.

## රාජ්‍ය මූල්‍ය කටයුතු*

1984 වසරේ දී රාජ්‍ය මූල්‍ය කටයුතු මඟින් අයවැය හිඟයෙහි සැළකිය යුතු අඩු වීමක් ඇතිවූවා මෙන්ම මීට ප්‍රථම බැංකු අංශයෙන් ලබාගත් ණයවලින් සැළකිය යුතු කොටසක් ආපසු ගෙවීමටද යෙදුණි. අයවැයට අදළ වර්තන ගිණුමේ අතිරික්තයක් ඇතිවූ අතර, එමගින් ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය සම්පත්වලින් කොටසක් සැපයින. එහෙයින් අයවැය කටයුතු සඳහා ලබාගත් ණය මුළුමනින්ම වාගේ ප්‍රාග්ධන වියදම මූල්‍යකරණය කිරීම සඳහා හිඟව පැවති සම්පත් ලබාගැනීමට සීමා විය.

* රජයේ ගිණුම් අවසාන වශයෙන් පිළියෙල කරන තෙක් තාවකාලික දත්තයන් මත පදනම් කර ඇත.

## 1 . 42 සංඛ්‍යා සටහන

### 1981 – 1984 දක්වා රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය(අ)
### (ද. දේ. නි. යට අනුපාතය වරහන් තුළ දැක්වේ.)

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1981 | 1982 | 1983 තාවකාලික | 1984 අනුමත කළ ඇස්තමේන්තු | 1984 තාවකාලික* |
|---|---|---|---|---|---|
| 1. ආදායම .. .. | 16,228 (19·1) | 17,809 (17·9) | 25,210 (20·7) | 30,770 | 37,731 (24·9) |
| 2. වියදම .. .. | 31,094 (36·6) | 37,900 (38·0) | 46,816 (38·5) | 47,313(ආ) | 53,593 (35·4) |
| 2·1 පුනරාවර්තන වියදම .. .. | 16,005 (18·8) | 20,110 (20·2) | 23,963 (19·7) | 28,077 | 28,926 (19·1) |
| 2·2 එකතු: අත්තිකාරම් ගිණුම් .. | 1,716 (2·0) | –879 (–0·9) | 1,120 (0·9) | 300 | 2,917 (1·9) |
| | 17,721 (20·8) | 19,231 (19·3) | 25,083 (20·6) | 28,377 | 31,843 (21·0) |
| වර්තන ගිණුම් අතිරික්තය (+)/හිඟය (–) | –1,493 (–1·8) | –1,422 (–1·4) | +127 (0·1) | +2,393 | +5,888 (3·9) |
| 2·3 ප්‍රාග්ධන වියදම .. .. | 13,373 (15·7) | 18,669 (18·7) | 21,733 (17·9) | 18,936 | 21,750 (14·4) |
| 3. අය වැය හිඟය .. | 14,866 (17·5) | 20,091 (20·1) | 21,606 (17·8) | 16,543 | 15,862 (10·5) |
| 4. ණය ආපසු ගෙවීම්(ඇ) | 1,608 (1·9) | 2,612 (2·6) | 5,302 (4·4) | 2,368(ඈ) | 2,229 (1·5) |
| 5. ශුද්ධ මූල්‍ය හිඟය .. .. | 13,258 (15·6) | 17,479 (17·5) | 16,580 (13·6) | 14,175 | 13,633 (9·0) |
| 6. අය වැය හිඟය පියවීම .. .. | | | | | |
| 6·1 වෙළෙඳ පොළ නොවන දේශීය ණය ගැනීම් | 400 (0·5) | 1,713 (1·7) | 2,385 (2·0) | — | 916 (0·6) |
| 6.2 දේශීය වෙළෙඳ පොළ ණය ගැනීම් .. | 6,296 (7·4) | 9,899 (9·9) | 8,965 (7·4) | 4,231 | 3,041 (2·0) |
| 6·2·1 බැංකු .. .. | 3,917(ඉ) (4·6) | 4,006(ඉ) (4·0) | 1,202(ඉ) (1·0) | 681 | –2,644 (–1·7) |
| 6·2·2 බැංකු නොවන .. .. | 2,379 (2·8) | 5,894 (5·9) | 7,762 (6·4) | 3,550 | 5,685 (3·7) |
| 6·3 විදේශීය මූල්‍ය .. .. | 8,208 (9·7) | 8,794 (8·8) | 10,950 (9·0) | 12,312 | 11,226 (7·4) |
| 6·3·1 ණය .. .. | 5,487 (6·5) | 5,418 (5·4) | 7,477 (6·1) | | 7,957 (5·2) |
| 6·3·2 දීමනා .. .. | 2,721 (3·2) | 3,376 (3·4) | 3,473 (2·9) | | 3,269 (2·2) |
| 6·4 මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම .. | –38 (–···) | –315 (–0·3) | –694 (–0·6) | — | 679 (0·4) |
| 7. ශුද්ධ මූල්‍ය හිඟය පියවීම | | | | | |
| 7·1 වෙළෙඳ පොළ නොවන දේශීය ණය ගැනීම් | 363 (0·4) | 1,664 (1·7) | 2,239 (1·8) | — | 820 (0·5) |
| 7·2 දේශීය වෙළෙඳපොළ ණය ගැනීම් | 5,331 (6·3) | 8,010 (8·0) | 5,250 (4·3) | 3,522 | 2,374 (1·6) |
| 7·2·1 බැංකු .. .. | 3,885 (4·6) | 3,990 (4·0) | 1,168 (1·0) | 681 | –2,760(ඉ) (–1·8) |
| 7·2·2 බැංකු නොවන .. .. | 1,446 (1·7) | 4,020 (4·0) | 4,082 (3·3) | 2,841 | 5,134 (3·4) |
| 7·3 විදේශීය මූල්‍ය .. .. | 7,602 (8·9) | 8,120 (8·1) | 9,785 (8·0) | 10,653 | 9,761 (6·4) |
| 7·3·1 ණය .. .. | 4,880 (5·7) | 4,744 (4·7) | 6,313 (5·2) | | 6,492 (4·2) |
| 7·3·2 දීමනා .. .. | 2,721 (3·2) | 3,376 (3·4) | 3,472 (2·8) | | 3,269 (2·2) |
| 7·4 මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම .. | –38 (–···) | –315 (–0·3) | –694 (–0·6) | — | 679 (0·4) |
| 8. රාජ්‍ය මූල්‍ය කටයුතු නිසා ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම .. .. | 3,847 (4·5) | 3,675 (3·7) | 474 (0·4) | 681 | –2,082 (–1·4) |
| 9. නොපියවූ රාජ්‍ය ණය (ශුද්ධ) .. .. | 58,659 (69·0) | 71,250 (71·4) | 86,423 (71·0) | — | 95,741 (63·2) |

මූලයන් : මහා භාණ්ඩාගාරය,
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) පරිශිෂ්ටයේ 31 වැනි සංඛ්‍යා සටහනෙහි පාද සටහන්වල දක්වා ඇති හේතූන් නිසා මෙම සංඛ්‍යා රජයේ ගිණුම්හි දක්වා ඇති සංඛ්‍යාවලින් වෙනස් වේ.

(ආ) ඌනා වියදම් සඳහා ගැලපුම් කළ පසු

(ඇ) නිදන් අරමුදල් දායක ගෙවීම්, රාජ්‍ය ණය සෘජු ආපසු ගෙවීම් සහ 1983 දී (තාවකාලික) රුපියල් දශ ලක්ෂ 277 ක ප්‍රමාණයක් වූ ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන්ට කළ දායක දීමනා ඇතුළත්ය. 1981 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 37 ක්ද, 1982 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 49 ක් ද, 1983 (තාවකාලික) වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 146 ක් සහ 1984 (තාවකාලික) වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 96 ක්ද වූ විදේශීය පරිපාලන ණය ආපසු ගෙවීම්ද ඇතුළත්ය.

(ඈ) 1984 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් ණය ආපසු ගෙවීම සඳහා නිදන් අරමුදල්වලට දායකවීම නතර කරන ලදී.

(ඉ) බැංකු අංශය වෙත රුපියල් ණය ආපසු ගෙවීම වෙනුවෙන් 1981 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 32 ක්ද, 1982 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 16 ක්ද, 1983 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 36 ක් සහ 1984 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 117 ක්ද ඇතුළත්ය.

* රජයේ ගිණුම් පිළියෙල කිරීම අවසන් වනතෙක් තාවකාලික දත්තයන් මත පදනම් කර ඇත.

**සමස්ත රාජ්‍ය මූල්‍ය තත්ත්වය**

අත්තිකාරම් ගිණුම් යටතේ ඇතිවූ ශුද්ධ ගෙවීම් ඇතුළත්ව රජයේ මුළු වියදම රුපියල් 5,359 කෝටි 30 ලක්ෂයක් විය. එයින්, ඉකුත් වසරට වඩා සියයට 14 ක වැඩි වීමක් පෙන්නුම් කෙරිනි. ඉකුත් වසරේ වියදම් වර්ධන වේගයට වඩා වසර තුළ පැවති වියදම් වර්ධනය ප්‍රතිශත අංක 10 කින් අඩුවීම නිසා, ද. දේ. නි. යට සාපේක්ෂව මුළු වියදම සියයට 38 ක සිට සියයට 35 දක්වා අඩු විය. මුළු ආදායම රුපියල් 3,773 කෝටි 10 ලක්ෂයක් වෙමින් 1983 වසරට වඩා සියයට 50 ක වැඩි වීමක් දක්වූ අතර, රුපියල් 588 කෝටි 80 ලක්ෂයක වර්තන ගිණුම් අතිරික්තයක් ඇති වීමට හේතු විය. සියයට 21 ක වැඩි වීමක් දක්වමින් පුනරාවර්තන වියදම රුපියල් 2,892 කෝටි 60 ලක්ෂයක් වූ අතර, 1983 වසරට වඩා දෙගුණයකටත් වඩා වැඩි වීමක් වාර්තා කරමින් අත්තිකාරම් ගිණුම්වල ශුද්ධ ගෙවීම් ප්‍රමාණය රුපියල් 291 කෝටි 70 ලක්ෂයක් විය. මුළු ප්‍රාග්ධන වියදම රුපියල් 2,175 කෝටිය දක්වා ඉතා සුළු වශයෙන් වැඩි විය. ඉකුත් වසරේ දී එම වැඩිවීම සියයට 16 ක් විය. සියයට 27 ක අඩු වීමක් දක්වමින් අයවැය හිඟය රුපියල් 1,586 කෝටි 20 ලක්ෂයක් විය. ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් කල අයවැය හිඟය සියයට 18 සිට සියයට 11 දක්වා අඩු විය.

අයවැය හිඟය, දේශීය සහ විදේශීය යන මූලයන් දෙකොටසින්ම ලබාගත් සම්පත්වලින් පියවන ලදී. විදේශීය මූලයන් මගින් හිඟයෙන් සියයට 71 ක් මූල්‍යකරණය කරන ලද අතර, 1983 දී එම ප්‍රමාණය සියයට 51 ක් විය. මුළු විදේශීය මූල්‍යකරණය රුපියල් 1,122 කෝටි 60 ලක්ෂයක් විය. විදේශීය මූලයන් වෙතින් වූ ණය ලැබීම් රුපියල් 795 කෝටි 70 ලක්ෂයක් වූ අතර දීමනා ප්‍රමාණය රුපියල් 326 කෝටි 90 ලක්ෂයක් විය.


දේශීය අංශයෙන් බැංකු නොවන වෙළෙඳ පොළ මූලයන් වෙතින් සහ වෙළෙඳ පොළ නොවන බැංකු නොවන මූලයන් වෙතින් වූ මුළු ණය ගැනීම් ප්‍රමාණය රුපියල් 660 කෝටි 10 ලක්ෂයක් විය. විදේශීය සහ දේශීය බැංකු නොවන මූලයන් වෙතින් ලබාගත හැකි වූ සම්පත් අයවැය හිඟයට වඩා රුපියල් 195 කෝටි 50 ලක්ෂයකින් වැඩි විය. රුපියල් 276 කෝටියක් වූ බැංකු අංශය වෙත ආපසු ගෙවන ලද ණය සඳහා සහ රුපියල් 67 කෝටි 90 ලක්ෂයක මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම් සඳහා ගැලපුම් කළ පසු ඉකුත් වසරේ වූ රුපියල් 47 කෝටි 40 ලක්ෂයක ප්‍රසාරණාත්මක බලපෑමට ප්‍රතිවිරුද්ධව වසරේ රාජ්‍ය මූල්‍ය කටයුතුවලින් ඇතිවූ සංකෝචනාත්මක බලපෑම රුපියල් 208 කෝටි 20 ලක්ෂයක් විය.

පසුගිය තෙවසරට අදළ සංසන්දනාත්මක දත්තයන් සහිතව 1984 වසර සඳහා රාජ්‍ය මූල්‍ය කටයුතුවල සම්පිණ්ඩනයක් 1.42 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. ඉකුත් වසර නවය සඳහා සංසන්දනාත්මක දත්තයන් සමඟ රාජ්‍ය මූල්‍ය කටයුතු නිසා, ඇතිවූ ශුද්ධ මූල්‍ය හිඟය සංඛ්‍යා ලේඛන පරිශිෂ්ඨයේ දක්වා ඇත.

**ආදායම**

1984 වසරේ දී රජයේ ආදායම නිරපේක්ෂ වශයෙන් මෙන්ම සාපේක්ෂ වශයෙන්ද තවදුරටත් වැඩි විය. ද. දේ. නි. යට සාපේක්ෂව රජයේ ආදායම සියයට 21 සිට සියයට 25 දක්වා වැඩි විය. නිරපේක්ෂ වශයෙන් සළකත්ම රජයේ ආදායම ඉකුත් වසරට වඩා සියයට 50 කින් වැඩිවී රුපියල් 3,773 කෝටි 10 ලක්ෂයක් විය. රජයේ ආදායම සම්බන්ධයෙන් ඉකුත් සය වසර තුළදී වාර්තා වූ ඉහළම වාර්ෂික වර්ධන වේගය මෙය විය. වසර තුළදී බදු ආදායම සියයට 51 කින් වැඩිවී රුපියල් 3,121 කෝටි 50 ලක්ෂයක් වූ අතර, බදු නොවන ආදායම සියයට 45 කින් වැඩිවී රුපියල් 651 කෝටි 60 ලක්ෂයක් විය. තේ බද්ද, ආනයන බදු, පිරිවැටුම් බදු, ආදායම් බදු සහ අපනයන බදුවලින් වූ ඉහළ ලැබීම් බදු ආදායමෙහි වැඩිවීමට විශාල වශයෙන් හේතුවිය. බදු නොවන ආදායමෙහි වූ වැඩි වීමට ප්‍රධාන වශයෙන් දායක වූයේ පොළී හා ලාභාංශ, ණය හා අත්තිකාරම් ආපසු ගෙවීම සහ රාජ්‍ය වෙළඳ ව්‍යවසායයන් වෙතින් වූ ඉහළ ලැබීමය.

# රජයේ ආදායම සහ වියදම




ශ්‍රී ලංකා මහ බැංකුව.

රජයේ ආදායමෙහි සිදුවූ මෙම වැඩි වීම, ආදායම් රැස් කිරීමේ ප්‍රයත්නයන් සම්බන්ධයෙන් වේගවත් බවක් ඇතිවූ 1983 වසරේ සිට දක්නට ලැබුන උපනතිය හා අනුකූල විය. තාවකාලික ගණනයන්ට අනුව, ද. දේ. නි. යේ වෙනස්වීමට අනුව රජයේ ආදායම් වෙනස් වීමේ අනුපාතය දක්වෙන ආදායම් සංවේදිතා සංගුණකය 1984 වර්ෂයේදී, 2.02 ක් විය. එය ඉකුත් වසරෙහි දී 1.89 ක්ව පැවතින. බදු ආදායම් සම්බන්ධයෙන් පැවැති සංවේදිතා සංගුණකය, 1983 දී වූ 1.56 ක් වූ අතර, 1984 දී එය 2.07 ක් විය. වසර තුළදී රජයේ ආදායම පිළිබඳව දක්නට ලැබුන විශේෂිත ක්‍රියාකාරිත්වය තුළින් විශාල වශයෙන් පිළිබිඹු වනුයේ අනපේක්ෂිත අයුරින් ලැබූ හදිසි ලාභයක් මෙන්ම නිදන් අරමුදල හා අදාළව ගිණුම් තැබීමේ ක්‍රියා පිළිවෙතෙහි වූ වෙනස්කම් සහ ඇතැම් අන්තර් රාජ්‍ය සංක්‍රාමයන්ය. ලෝක වෙළෙඳ පොළෙහි වෘක්ෂ භෝග සඳහා වූ ඉහළ මිළ ගණන් මෙන්ම පහත වැටුණු බණිජ තෙල් මිළ ද ආර්ථිකය තුළ බදු අය කළ හැකි විශාල ආදායම් අතිරික්තයක් උත්පාදනය කිරීමෙහිලා උපකාරි විය. රජයේ ගණුදෙනු ඇතුළත් වනසේ ආදායම් බදු, පිරිවැටුම් බදු සහ ආනයන බදු ආවරණය, පුළුල් කිරීම ද විශාල වශයෙන් රජයේ ආදායම් මට්ටම ඉහළ නැංවීමට හේතු විය. මීට අමතරව, මේ දක්වා නිදන් අරමුදලේ ආදායම් සේ සළකනු ලැබූ නිදන් අරමුදල් විසින් ලබන ලද පොළිය ද, වසර තුළදී රජයේ ආදායම් ශීර්ෂයක් සේ ඇතුළත් කරනු ලැබ ඇත. මීට ප්‍රථම, නිදන් අරමුදල් ආදායමින් වැඩි ප්‍රමාණයක් නිදන් අරමුදල විසින්ම, රජයේ සුරැකුම්පත්වල ආයෝජනය සඳහා උපයෝජනය කරන ලදී. වාර්තා ගත වූ ලැබීම්වල මේ වසරේදී වාර්තා වූ පසුගිය වර්ෂවල ආනයන බදු එකතු කිරීම්ද ඇතුළත්ය.

රජයේ වැය ප්‍රතිපාදන උපයෝගි කර ගනිමින් ගෙවන ලද බදු ප්‍රමාණයන්, නිදන් අරමුදලේ පොළී ආදායම සහ ඉදිරියට ගෙනා ආනයන බදු රහිතව ගත් කල මුළු ආදායම් වර්ධනය ඉකුත් වසරට වඩා සියයට 30 ක් විය. මෙම අන්තර් රාජ්‍ය සංක්‍රාම රහිතව වුවද, ආදායම් සංවේදිතා සංගුණකය 1.23 ක් වූයේ 1984 වසරෙහි රජයේ ආදායමෙහි සංවේදිතා ස්වරූපයක් පෙන්නුම් කරමිනි. කෙසේ වුවද, වෘක්ෂ භෝග අංශයෙන් ඇති වූ ආදායම් වැඩිවීමද, අත්හළ විට, මුළු ආදායමේ වැඩිවීම සියයට 18 ක් වන අතර, එය ද. දේ. නි. යේ නාමික වර්ධන වේගයට වඩා අඩු වූවකි. ආදායමෙහි වූ මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1984 අයවැය මගින් සහ වසර තුළදී, ආදායම් වැඩි කිරීම පිණිස හඳුන්වා දුන් ක්‍රියා මාර්ගයන්ය. මේ අනුව වසර තුළදී දක්නට ලැබුනු ඉහළ ආදායම් සංවේදිතාවය තුළින් ආදායම් ක්‍රමයේ ඇතිවූ ප්‍රගතියකට වඩා තාවකාලික ස්වරූපයක් ගත් සිද්ධියක් දැක්වීමට යෙදුණි. මෙමගින් පැහැදිලි වනුයේ, මේ දක්වා හඳුන්වා දුන් නොයෙකුත් ආදායම් ක්‍රියා මාර්ගයන්ද ආදායම් ක්‍රමයෙහි ඇති කළ ගුණාත්මක වර්ධනයන්ද, ආදායම නම්‍ය කිරීමට මෙන්ම සංවේදී කිරීමටත් ප්‍රමාණවත් නොවුන බවයි. බදු ආවරණය සහ පදනම පුළුල් කිරීම වැනි ක්‍රියා මාර්ග ඇතුළත් දැඩි හා අඛන්ඩ ආදායම් සංචලනය කිරීමේ ප්‍රයත්නයක නිරතවීමේ අවශ්‍යතාවය මෙමගින් තවදුරටත් අවධාරණය කරයි. කෙසේ වෙතත්, සමහර අවස්ථාවන්හිදී, නිෂ්පාදනය දිරිගැන්වීම පිණිස ඇතැම් බදු අනුපාතයන් අඩු කිරීම නිසා රජයට ආදායම අහිමිවන අවස්ථා ඇතිවන බවද මෙහිලා සඳහන් කිරීම උචිතය.

විදේශීය අංශයෙන් ලත් වැඩිවූ ආදායම්ද, ගිණුම් තැබීමේ ක්‍රියා පිළිවෙත්හි සිදුවූ ප්‍රතිශෝධන සහ වසර තුළදී ක්‍රියාත්මක කළ නව ආදායම් ක්‍රියා මාර්ගයන්ද 1984 රජයේ ආදායම් ව්‍යුහයේ වෙනස්කම් ඇති කිරීමෙහිලා හේතු විය. 1980 වසරෙහි පටන් පැවති උපනතිය ආපසු හරවමින් මුළු ආදායමට සාපේක්ෂව බදු ආදායම් කොටස 1983 දී පැවැති සියයට 82 සිට 1984 දී සියයට 83 දක්වා ඉහළ ගියේය. ජාත්‍යන්තර වෙළඳාම මත වූ බදු ආදායම් මුළු බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 1983 දී පැවති සියයට 48 සිට 1984 දී සියයට 56 දක්වා වැඩිවූ අතර, නිෂ්පාදනය හා වියදම් මත රැඳුන බදුවලට සාපේක්ෂව මෙම බදුවල කොටස සියයට 83 සිට සියයට 82 දක්වා අඩුවිය. මීට ප්‍රථම වාර්ෂික වාර්තාවන්හිදී ද අවධාරණය කළ පරිදි, ආදායම් සංචලනය කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳාම කෙරේ දැඩි රැඳියාවක් පැවැතීම නිසා ජාත්‍යන්තර වෙළඳාමෙහි ඇතිවන උච්චාවචන මගින් දේශීය අයවැය කෙරේ ඇතිවන අයහපත් බලපෑම්වලට ඇති අවකාශය

වැඩි කරනු ලබයි. බදු නොවන ආදායම් කාණ්ඩයේ, පොළී, ලාභ සහ ලාභාංශවලට අදාළ කොටස සියයට 15 සිට සියයට 25 දක්වා වැඩි වූ අතර, රජයේ වෙළඳ ව්‍යවසායයන්ගේ දළ ලැබීම්වලට අදාළ කොටස සියයට 29 ක් ලෙසින් නොවෙනස්ව පැවතුණි. මෙම බදු කාණ්ඩයෙහි ණය සහ අත්තිකාරම් ආපසු ගෙවීම් කොටස සියයට 3 සිට සියයට 8 දක්වා වැඩි විය.

1984 වර්ෂයේදී පිරිවැටුම් බදු වෙතින් වූ මුළු ලැබීම් ප්‍රමාණය රුපියල් 814 කෝටි 40 ලක්ෂයක් වූ අතර, එය ඉකුත් වසරට වඩා සියයට 31 ක වැඩිවීමක් පෙන්නුම් කරමින්, 1984දී මුළු බදු ආදායමින් සියයට 26 ක් විය. පිරිවැටුම් බදුවලින් ලත් මුළු බදු ලැබීම් ප්‍රමාණය ද.දේ.නි. යේ ප්‍රතිශතයක් සේ ගත් කල 1983 සියයට 5.1 සිට 1984 දී සියයට 5.4 දක්වා වැඩි විය. මෙම වැඩිවීමට විශාල වශයෙන් හේතු වූයේ බදු අනුපාතිකයන් වැඩි කිරීමත්, රජයේ ආනයන ද ඇතුළත් වන පරිදි පිරිවැටුම් බදු ආවරණය පුළුල් කිරීමත් සහ වඩා විධිමත් ලෙස බදු නීතිය ක්‍රියාත්මක කිරීම සහ බදු ගෙවීම කෙරේ වැඩි අනුකූලතාවයක් දක්වීමත්ය. ඉකුත් වසරට වඩා සියයට 79 ක තියුණු වැඩිවීමක් පෙන්නුම් කරමින් මුළු වරණ අලෙවි බදු ආදායම රුපියල් 578 කෝටි 70 ලක්ෂයක් විය. මෙහි ප්‍රතිඵලයක් සේ මුළු බදු ආදායමෙහි වරණ අලෙවි බදුවලට අදාළ කොටස සියයට 16 සිට සියයට 19 දක්වා වැඩි විය. ද.දේ.නි.යට සාපේක්ෂව වරණ අලෙවි බදු ලැබීම් සියයට 2.7 සිට සියයට 3.8 දක්වා වැඩි විය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ තේවලින් (වටිනාකම අනුව) ලැබූ බදු ආදායම 1983 වසර හා සසඳන කල තෙගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ යාමයි.

1983 වසර සමග සැසඳීමේදී සියයට 29 ක වැඩිවීමක් වාර්තා කරමින් අපනයන බදුවලින් ලද මුළු ආදායම රුපියල් 317 කෝටි 50 ලක්ෂයක් විය. එය ඉකුත් වසර කීපය තුළ පැවති උපනතියෙහි ආපසු හැරීමක් විය. කෙසේ වුවද, මුළු බදු ආදායමේ ප්‍රතිශතයක් සේ ගත් කල, අපනයන බදු 1983 දී පැවති සියයට 12 සිට 1984 දී සියයට 10 දක්වා තවදුරටත් පහත වැටුණි. එහෙත් ද.දේ.නි. යට සාපේක්ෂව, අපනයන බදු ආදායම 1984 දී සියයට 2.1 දක්වා සුළු වශයෙන් වැඩිවිය. අපනයන බදු ආදායම වැඩිවීමට විශාල වශයෙන් හේතු වූයේ, තේ හා රබර් අපනයනවලින් වූ ඉහළ ලැබීමය. වසර තුළදී මුළු ආනයන බදු ආදායම රුපියල් 794කෝටි 50 ලක්ෂයක් වූ අතර, එය ඉකුත් වසරට වඩා සියයට 64 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. 1984 දී මුළු බදු ආදායමින්, ආනයන බදු සියයට 25 කට හිමිකම් පෑවේය. ද.දේ.නි. යේ ප්‍රතිශතයක් සේ ආනයන බදු සියයට 4.0 සිට සියයට 5.2 දක්වා වැඩිවිය. මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 1984 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි, රජයේ ආනයන ද ඇතුළත් වන සේ ආනයන බදු ආවරණය පුළුල් කිරීමයි.

ඉකුත් වසරට වඩා සියයට 63 ක වැඩිවීමක් වාර්තා කරමින් ආදායම් බදු ආදායම රුපියල් 548 කෝටියක් විය. 1984 දී ආදායම් බදුවලින් ලැබූ ආදායම, මුළු ආදායමින් සියයට 18 ක් විය. ආදායම් බදු, ද.දේ.නි. යට සාපේක්ෂව 1983 දී පැවති සියයට 2.8 සිට 1984 දී සියයට 3.6 දක්වා වැඩි විය. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, සාමූහික ආදායම් බදු ලැබීම්හි සියයට 50 ක තියුණු වැඩිවීමය. රාජ්‍ය සංස්ථා වෙතින් වූ ඉහළ බදු ලැබීම්, මෙම වැඩිවීමට මූලික වශයෙන් දායක විය. සාමූහික නොවන බදු ආදායම දෙගුණයක් තරම් විය.

1984 වර්ෂයේදී බදු නොවන ආදායම් එකතුව රුපියල් 651 කෝටි 60 ලක්ෂයක් වූ අතර, එය ඉකුත් වසරට වඩා සියයට 45 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. මුළු ආදායමෙහි බදු නොවන ආදායම් කොටස සියයට 18 සිට සියයට 17 දක්වා සුළු වශයෙන් අඩුවිය. බදු නොවන ආදායම් ප්‍රමාණය නිරපේක්ෂ වශයෙන් වැඩිවීමට විශාල වශයෙන්ම හේතු වූයේ, වසර තුළදී ක්‍රියාත්මක කරනු ලැබූ ආදායම් වැඩිකර ගැනීමේ ක්‍රියා මාර්ගයන් සහ නිදන් අරමුදල්වලින් ලැබූ පොළී ආදායම් රජයේ ආදායමක් සේ සැළකීමත්ය. කෙසේ වුවද, නිදන් අරමුදල් පොළී රහිතව ගත් කල පොළී ආදායම 1983 වසරට වඩා සියයට 25 ක අඩුවීමක් වාර්තා කළේය. 1984 වසර තුළදී ලාභ සහ ලාභාංශ ආදායම රුපියල් 55 කෝටි

90 ලක්ෂයක් වූ අතර, එය 1983 ට වඩා ආසන්න වශයෙන් තුන් ගුණයක වැඩිවීමක් වාර්තා කළේය. මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රාජ්‍ය සංස්ථා විසින් සිය බදු ගෙවූ පසු ඉතිරි ලාභවලින් සියයට 50 ක ලාභාංශයක් රජයට පැවරීමයි. බදු නොවන ආදායමෙහි ප්‍රධාන අයිතමය වූයේ මහ බැංකුව විසින් ලාභවලින් රුපියල් 165 කෝටියක් රජයට පැවරීමයි. මෙම මාරු කිරීම මුදල් නීති පනත අනුව සිදු කළ අතර, මහ බැංකුව වෙත වූ රජයේ ණය වගකීම් පියවා ගැනීම පිණිස මෙය උපයෝජනය කරන ලදී.

රජයේ ආදායම පිළිබඳව, සවිස්තරාත්මක දත්තයන් සංඛ්‍යා ලේඛන පරිශිෂ්ඨයේ දක්වා ඇත.

**වියදම**

1984 වසරේදී රජයේ වියදම සියයට 14 කින් වැඩි විය. එය 1983 දී පැවැති වැඩිවීමේ ප්‍රමාණයට වඩා අඩුවූවකි. ද. දේ. නි. යට සාපේක්ෂව මුළු වියදම සියයට 38 සිට සියයට 35 දක්වා අඩු විය. පුනරාවර්තන සම්මත යටතේ වියදම සියයට 21 කින් වැඩි වූ අතර, අත්තිකාරම් ගිණුම්වල ශුද්ධ ගෙවීම් ප්‍රමාණය 1983 වසර මෙන් තෙගුණයකට ආසන්න විය. ප්‍රාග්ධන සම්මත යටතේ වියදම සුළු වශයෙන් වැඩිවිය. කෙසේ වුව ද, 1984 වසරේ වාර්තා වූ වියදම මුල් අයවැය ඇස්තමේන්තු අනුව අපේක්ෂිත ප්‍රමාණය බොහෝ දුරට ඉක්මවා ගියේය. මුල් අයවැය ඇස්තමේන්තුවට අනුව පුනරාවර්තන වියදම යටතේ සියයට 17 ක වැඩිවීමක් සහ ප්‍රාග්ධන වියදම යටතේ සියයට 13 ක අඩුවීමක් සහිතව මුළු වියදම 1983 වසරේ පැවැති මට්ටමට වඩා සියයට 1 කින් වැඩිවේයැයි අපේක්ෂා කරන ලදී. අත්තිකාරම් ගිණුම් කටයුතු යටතේ ශුද්ධ ගෙවීම් ප්‍රමාණය රුපියල් 30 කෝටියකට හෙවත් 1983 දී වාර්තාවූ ප්‍රමාණයෙන් හතරෙන් කොටසකට ආසන්න වේ යැයි ඇස්තමේන්තු කර තිබින. 1984 වසරේ මුල් භාගයේ දී යෝජිත වියදම් කපා හැරීම් මගින් වියදම් වර්ධනය තවදුරටත් අඩුවේ යැයි අපේක්ෂා කරන ලදී.

කෙසේ වුවද, වසර තුළ පැන නැගුණු වියදම් වැඩිවෙන ආකාරයේ හේතු සාධක නිසා සැළකිය යුතු ප්‍රමාණයක අය වැය සම්පත් ඇද ගැනීමට යෙදුණු පරිපූරක ඇස්තමේන්තු විශාල සංඛ්‍යාවක් අනුමත කිරීම ද අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා මුදල් මුදා හැරීම ද සිදුවිය. වසර තුළදී ප්‍රාග්ධන සම්මත යටතේ රුපියල් 533 කෝටි 50 ලක්ෂයකින් ද, පුනරාවර්තන සම්මත යටතේ රුපියල් 191 කෝටි 30 ලක්ෂයකින් ද සමන්විත රුපියල් 724 කෝටි 90 ලක්ෂයක පරිපූරක ඇස්තමේන්තු අනුමත කරන ලදී. මුළු පරිපූරක ඇස්තමේන්තුවලින් රාජ්‍ය නියෝජ්‍යායතනයන් වෙනුවෙන් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදනය කළ රුපියල් 229 කෝටි 40 ලක්ෂයක් ඇතුළත් රුපියල් 245 කෝටි 50 ලක්ෂයක ප්‍රමාණයක් අන්තර් රාජ්‍ය පැවරුම් විය. සෙසු පරිපූරක ඇස්තමේන්තු විදේශීය හෝ දේශීය හෝ මූලයන්ගෙන් මූල්‍යකරණය කළ වියදම්වලට අදාළ විය. විදේශීය ආධාරවලින් මූල්‍යකරණය කරන ලද වියදම් නිසා, පැන නැගුණු පරිපූරක ඇස්තමේන්තු ප්‍රමාණය රුපියල් 239 කෝටි 60 ලක්ෂයක් විය. සෙසු පරිපූරක ඇස්තමේන්තුවලින් කොටසක් ආරක්ෂක හේතූන් නිසා සහ අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා ඇතිවිය. එහෙත් වියදම් කළමනාකරණය හැඩ ගැස්වීමේ අවශ්‍යතාවය තවදුරටත් අවධාරණය කරමින් වසර තුළදී අනුමත කළ පරිපූරක ඇස්තමේන්තු ප්‍රමාණය තරමක ඉහළ මට්ටමක පැවති බව සටහන් කළ යුතුව ඇත.

ඉහත සඳහන් වියදම් ගි වර්ධන රටාව පිළිබිඹු කරමින් පුනරාවර්තන වියදම සහ අත්තිකාරම් ගිණුම් කටයුතු මත ගෙවීම් මුළු වියදමින් සියයට 59 කට ආසන්න වූ අතර, පසුගිය වර්ෂයේ මෙය සියයට 54 ක් විය. ද.දේ.නි. යට සාපේක්ෂ වශයෙන් පුනරාවර්තන වියදම සහ අත්තිකාරම් ගිණුමේ ශුද්ධ ගෙවීම 1983 දී සියයට 20.6 සිට 1984 දී සියයට 21.0 දක්වා වැඩිවූ අතර, පුනරාවර්තන සම්මත යටතේ වියදමට අදාළ අනුපාතය සියයට 19.7 සිට සියයට 19.1 දක්වා අඩුවිය. ද. දේ. නි. යේ ප්‍රතිශතයක් වශයෙන් ප්‍රාග්ධන වියදම සියයට 17.9 ක සිට සියයට 14.4 දක්වා අඩු විය.

වසර තුළදී දක්නට ලැබුණු පුනරාවර්තන වියදම් වර්ධන රටාව තුළින් වැටුප් සහ වේතන හැර අනෙකුත් භාණ්ඩ සහ සේවා සැළකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කළ අතර, සංක්‍රාම ගෙවීම්වල වර්ධන වේගයෙහි අඩුවීමක් විය. වැටුප් හා වේතන ඇතුළත් භාණ්ඩ හා සේවා සඳහා වියදම රුපියල් 1,356 කෝටි 90 ලක්ෂයක් දක්වා සියයට 32 කින් වැඩිවූ අතර, රුපියල් 1,535 කෝටි 80 ලක්ෂය දක්වා සංක්‍රාමයන් සියයට 12 කින් වැඩි විය. භාණ්ඩ හා සේවාවල වියදමට රජයේ දෙපාර්තමේන්තු සහ නියෝජ්‍යායතනවලට බදු ගෙවීම සඳහා වූ විශාල මුදල් වෙන් කිරීම් ඇතුළත් විය. මීට අතිරේකව ඉහළ ගිය ආනයන බදු ප්‍රතිදාන ක්‍රමයේ වියදම සහ ආරක්ෂක වියදම්, අනෙකුත් භාණ්ඩ හා සේවා මත වියදම් වැඩිවීමට විශාල වශයෙන් හේතු විය. සංස්ථාවන්ට කරන ලද සංක්‍රාමවල පහත වැටීමක් නිරපේක්ෂ වශයෙන් විය. වසර තුළදී පොළී ගෙවීම් හා සම්බන්ධ වැඩිවීමේ වේගයද අඩු විය. කෙසේ නමුත් කුටුම්භයන් සහ වෙනත් කාණ්ඩයන් වෙත කරන ලද පැවරුම් 1983 වසරට වඩා සැළකිය යුතු අන්දමේ වැඩිවීමක් දැක්විය.

ඉහත දැක්වූ වියදම් වර්ධන රටාව පිළිබිඹු කරමින් මුළු පුනරාවර්තන වියදමින් සංක්‍රාමවල කොටස 1983 දී සියයට 57ක සිට 1984 දී සියයට 53 දක්වා අඩු විය. වැටුප් හා වේතන, පොළී ගෙවීම් සහ විශ්‍රාම වැටුප්වල ඒකාබද්ධ වියදම රුපියල් 1,568 කෝටි 40 ලක්ෂයක් වෙමින් මුළු වියදමෙන් එහි කොටස ඉකුත් වසරේ පැවති සියයට 59 ක සිට සියයට 54 දක්වා අඩු විය. මෙම ශීර්ෂයන් තුන සඳහා වූ වියදම සියයට 10 ක වැඩි වීමක් දැක්විය. රුපියල් 177 කෝටි 50 ලක්ෂයක මුළු වියදමක් සහිතව වූ මුළු පුනරාවර්තන වියදමෙන් රාජ්‍ය, වෙළෙඳ ව්‍යවසායයන්ගේ කොටස සියයට 6 ක් සේ නොවෙනස්ව මෙන් පැවතින. වෙළෙඳ ව්‍යවසායයන් මත වියදම සියයට 24 කින් වැඩි විය.

භාණ්ඩ හා සේවා සඳහා වූ මුළු පුනරාවර්තන වියදම වැටුප් හා වේතන වෙනුවෙන් රුපියල් 618 කෝටි 50 ලක්ෂයකින් ද වෙනත් භාණ්ඩ හා සේවා වෙනුවෙන් රුපියල් 738 කෝටි 40 ලක්ෂයකින් ද සමන්විත විය. වර්ෂය තුළදී වැටුප් හා වේතන සඳහා වියදම 1983 වසරට වඩා සියයට 7 ක වැඩිවීමක් වාර්තා කරන ලදී. මෙය ප්‍රධාන වශයෙන් 1984 මාර්තු සහ සැප්තැම්බර් මාසවල ජීවන වියදම් දීමනාව අවස්ථා දෙකකදී වැඩි කිරීම නිසා සිදු විය. රජයේ වෙනත් භාණ්ඩ හා සේවා මත වියදම සියයට 63 කින් වැඩි වූ අතර, එයට ආංශික වශයෙන් හේතු වූයේ රජයේ සහ එහි නියෝජ්‍යායතන සඳහා බදු ගෙවීම් වෙනුවෙන් ඉහළ වියදමක් දැරීමට වීමය.

සංක්‍රාම පිළිබඳ සැළකීමේදී භාණ්ඩාගාරයේ කෙටි කාලීන ණය ගැනීම් මත ගෙවූ පොළියද ඇතුළුව මුළු පොළී ගෙවීම් ප්‍රමාණය සියයට 11 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් රුපියල් 731 කෝටි 90 ලක්ෂයක් විය. මෑත කාලයේදී වාර්තාගත වූ අඩුම මට්ටමකින් පොළී ගෙවීම් වාර්ෂිකව වැඩි වූ අවස්ථාව මෙය විය. එම නිසා මුළු වියදමෙහි කොටසක් වශයෙන් පොළී ගෙවීම් ප්‍රමාණය සියයට 28 සිට සියයට 25 දක්වා අඩු විය. කෙසේ වුව ද මුළු සංක්‍රාම ගෙවීම්වලින් එහි කොටස නොවෙනස්ව පැවතින. ද. දේ. නි. යට සාපේක්ෂව පොළී ගෙවීම් ප්‍රමාණය සියයට 5.4 ක සිට සියයට 4 .8 දක්වා පහත වැටින. පොළී ගෙවීම් සම්බන්ධයෙන් වූ මෙවැනි තත්ත්වයකට හේතු වූයේ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් ගෙවා නිම කිරීමත් රුපියල් ණය යටතේ ලබාගත් ණය අඩු මට්ටමක පැවතීමත් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පොළී අනුපාතිකයන් අඩු වීමත්ය. ඉකුත් වසරට වඩා සියයට 20 ක වැඩිවීමක් වාර්තා කරමින් මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය රුපියල් 218 කෝටියක් විය. මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන් ජීවනාධාර දීමනා ගෙවීමේ ප්‍රතිශෝධනයන් නිසා සිදු විය.

පොළී ගෙවීම් සහ විශ්‍රාම වැටුප් ගෙවීම් රහිතව ගත් කළ ඉතිරි සංක්‍රාමයන් සියයට 12ක වැඩි වීමක් වාර්තා කරමින් රුපියල් 585 කෝටි 80 ලක්ෂයක් විය. එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 20 ක් වූ අතර, ඉකුත් වසරේදී එය සියයට 22 ක් විය. මෙම සංක්‍රාමයන්ට සංස්ථාවන් වෙත පැවරුම් කළ රුපියල් 174 කෝටි 90 ලක්ෂයක් ද, පළාත් පාලන අධිකාරීන් වෙත වූ රුපියල් 59 කෝටි 70 ලක්ෂයක්ද, කුටුම්භයන් සඳහා කරන ලද සංක්‍රාම සහ අනෙකුත් සංක්‍රාම වෙනුවෙන් වූ රුපියල් 351 කෝටි 20 ලක්ෂයක්ද ඇතුළත් විය. සංස්ථාවන් සඳහා කරන ලද වර්තන සංක්‍රාමයන් පිළිබඳ විස්තරයක් සංඛ්‍යා ලේඛන පරිශිෂ්ඨයෙහි ඉදිරිපත් කර ඇත.

කුටුම්භ හා අනෙකුත් කාණ්ඩයන්ට අදාළ පැවරුම් සියයට 21 කින් වැඩි විය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ භූමිතෙල් මුද්දර ක්‍රමය සහ අනෙකුත් ශුභසාධක ගෙවීම්-වල ඉහළ ගිය වියදමය. සුළු වශයෙන් අඩුවීමක් දැක්වූ ආහාර මුද්දර ක්‍රමය සඳහා මුළු වියදම රුපියල් 140 කෝටි 50 ලක්ෂයක් වූ අතර භූමිතෙල් මුද්දර ක්‍රමය සඳහා වියදම රුපියල් 39 කෝටි 70 ලක්ෂයක් විය. ළදරු කිරි ආහාර සඳහා සහනාධාරය රුපියල් 9 කෝටියක් විය. මෙම කොටසට නොපියවන ලද අත්තිකාරම් වෙනුවෙන් ආහාර කොමසාරිස් විසින් භාණ්ඩා-ගාරයට ගෙවනු ලබන පොළිය වෙනුවෙන් වූ රුපියල් 16 කෝටි 10 ලක්ෂයක සහනාධාර ප්‍රමාණයක් ද ඇතුළත්ය. ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත ගෙවූ සහනාධාර ප්‍රමාණය රුපියල් 49 කෝටි 80 ලක්ෂයක් විය.

අත්තිකාරම් ගිණුම් කටයුතු යටතේ රුපියල් 291 කෝටි 70 ලක්ෂයක ශුද්ධ ගෙවීමක් සිදුවිය. 1983 දී වූ ශුද්ධ ගෙවීම් ප්‍රමාණය රුපියල් 112 කෝටියක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අත්තිකාරම් ගිණුම් කටයුතු නිසා ඇතිවූ පැහැදම 1984 මුළු වියදමින් සියයට 5 කට ආසන්න විය. ඉකුත් වසරේදී එය සියයට 2 ක් විය. අත්තිකාරම් ගිණුම් යටතේ ඇති වූ ශුද්ධ ගෙවීම් ප්‍රමාණයේ වැඩිවීමට විශාල වශයෙන් හේතු වූයේ ද්‍රවශීලතා ගැටළු සහිත සංස්ථාවන්ට දෙන ලද අත්තිකාරම්වල වැඩිවීමය. එසේම සමහර සංස්ථාවන්හි අලාභයන් පියවීම සඳහාද වූ ගෙවීම් විය. අත්තිකාරම් ගිණුම් සහ අතිරික්ත ශේෂයන්ගෙන් ණය යටතේ සංස්ථාවන් සඳහා වූ මුළු ශුද්ධ ගෙවීම් ප්‍රමාණය රුපියල් 194 කෝටි 90 ලක්ෂයක් විය. 1983 දී ශුද්ධ ගෙවීම් ප්‍රමාණය රුපියල් 46 කෝටි 80 ලක්ෂයක් විය. රජයේ දෙපාර්තමේන්තු වෙනුවෙන් වූ මුළු ශුද්ධ අත්තිකාරම් ගෙවීම් ප්‍රමාණය 1983 වසරේ රුපියල් 41 කෝටි 60 ලක්ෂය සමඟ සැසඳීමේදී රුපියල් 85 කෝටි 10 ලක්ෂයක් විය. ගබඩා සහ ද්‍රව්‍ය ගිණුම් යටතේ 1983 වසරේ වූ රුපියල් 19 කෝටි 30 ලක්ෂයක ශුද්ධ ගෙවීම සහ සැසඳීමේ දී මෙම වසරේ ශුද්ධ අත්තිකාරම් ප්‍රමාණය රුපියල් 15 කෝටි 40 ලක්ෂයක් විය. කෙසේ වුවද, අනෙකුත් අත්තිකාරම් යටතේ රුපියල් 3 කෝටි 70 ලක්ෂයක ලැබීමක් විය.

ණය ආපසු ගෙවීම් ඇතුළත් ප්‍රාග්ධන වියදම 1984 දී සුළු වැඩිවීමක් දක්වමින් රුපියල් 2,175 කෝටියක් විය. සැසඳීමේදී 1983 වසරේදී ප්‍රාග්ධන වියදමෙහි වූ වැඩිවීම සියයට 16 ක් විය. විශාල පරිපූරක ඇස්තමේන්තු ප්‍රමාණයක් තිබියදී ද ප්‍රාග්ධන වියදම සුළු වශ-යෙන් පමණක් වැඩිවීමට හේතු වූයේ රුපියල් ණය ආපසු ගෙවීම සඳහා නිදන් අරමුදල් දායකදීමනා අවලංගු කිරීම සහ සමහර සම්මතයන් යටතේ වාර්තා වූ ඉහළ මට්ටමේ ඌන වියදම් ය. 1984 වසරේ වූ ඌන වියදම් ආංශික වශයෙන් වසරේ මුල් භාගය තුළදී සිදුකරන ලද වියදම් කපා හැරීම නිසා ඇති විය.

ණය ආපසු ගෙවීම් රහිතව මුළු ප්‍රාග්ධන වියදම 1983 වසරට වඩා සියයට 17 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් 1,952 කෝටි 10 ලක්ෂයක් විය. ලංකා විදුලිබල මණ්ඩලය වෙනු-වෙන් බදු ගෙවීම් සඳහා වූ රුපියල් 81 කෝටි 80 ලක්ෂයක වෙන් කිරීමක් ද වසර සඳහා වූ ප්‍රාග්ධන වියදමට ඇතුළත් විය. ශුද්ධ ප්‍රාග්ධන වියදම (ණය ආපසු ගෙවීම් හා බදු ගෙවීම් සඳහා වූ ප්‍රතිපාදන රහිතව මුළු ප්‍රාග්ධන වියදම) සියයට 12 ක වැඩිවීමක් දැක්විය. එසේ වුවද, ද.දේ.නි. යට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම සියයට 13.7 ක සිට සියයට 12.3 දක්වා 1984 වසර තුළදී අඩු විය. ශුද්ධ ප්‍රාග්ධන වියදම, ද.ජා.නි.යේ ගම්‍ය මිළ ගැලපුම් මගින් ගැලපුම් කළ පසුව 1982 මිළ ගණන් අනුව ඉකුත් වසරේ රුපියල් 1,459 කෝටි 20 ලක්ෂය සමග සැසඳීමේ දී සියයට 5 ක අඩුවීමක් දක්වමින් 1984 වසරේදී රුපියල් 1,386 කෝටි 40 ලක්ෂයක් විය. කෙසේ වුව ද වසර සඳහා වූ ප්‍රාග්ධන වියදමට භාණ්ඩාගාර තැන්පතුවලට මාරු කරනලද වසර තුළදී උපයෝජනය නොකළ රුපියල් 99 කෝටි 20 ලක්ෂයක වියදම් ප්‍රතිපාදන ඇතුළත් විය. සැසඳීමේදී 1983 වසරේදී මාරු කරන ලද වියදම් ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් 183 කෝටි 60 ලක්ෂයක් විය. මෙම සංක්‍රාමයන් වෙනුවෙන් ගැලපුම් කළ පසුව, ප්‍රාග්ධන වියදම නාමික වශ-යෙන් සියයට 19 ක වැඩිවීමක් දැක්වූ අතර, මූර්ත වශයෙන් සියයට 1 ක සුළු අඩුවීමක් දැක්විය.

ප්‍රාග්ධන සම්මත යටතේ වාර්තා වූ මුළු වියදමින් සංස්ථාවන් වෙත කරන ලද සංක්‍රාම ප්‍රමාණය 1983 වසරට වඩා සියයට 8 ක වැඩිවීමක් දක්වමින් රුපියල් 1,120 කෝටි 50 ලක්ෂයක් විය. එසේම සමහර සංස්ථාවන්ට ණය වශයෙන් ලබා දුන් රුපියල් 64 කෝටි 60 ලක්ෂයක ආයෝජන සම්පත් සඳහා වූ වෙන්කිරීම් ද විය. සැසඳීමේ දී ඉකුත් වසරේ මෙම වෙන්කිරීම් ප්‍රමාණය රුපියල් 80 කෝටි 10 ලක්ෂයක් විය. පළාත් පාලන අධිකාරීන් වෙත සහ වෙනත් ආයතන සඳහා කරන ලද ප්‍රාග්ධන සංක්‍රාමයන්ගේ ප්‍රමාණය 1983 දී රුපියල් 32 කෝටි 70 ලක්ෂය සමග සැසඳීමේ දී රුපියල් 22 කෝටි 50 ලක්ෂයක් විය. රජයේ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ සෘජුවම දැරීමට යෙදුණු ප්‍රාග්ධන වියදම් ඉකුත් වසරට වඩා සියයට 44 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් 744 කෝටි 50 ලක්ෂයක ප්‍රමාණයක් විය. වසර තුළදී ප්‍රාග්ධන සම්මත යටතේ වූ ඌන වියදම රුපියල් 530 කෝටි 60 ලක්ෂයක් හෙවත් පරිපූරක ඇස්තමේන්තු ඇතුළත්ව මුළු ප්‍රතිපාදනයන් ගෙන් සියයට 21 ක් විය. අමාත්‍යාංශ අනුව වියදම් පිළිබඳ වර්ගීකරණයක් සහ සංස්ථාවන්ට කරන ලද සංක්‍රාමයන් සහ ණය දීම පිළිබඳ විස්තර සංඛ්‍යාලේඛන පරිශිෂ්ඨයෙහි ඉදිරිපත් කර ඇත.

**අයවැය හිඟය පියවීම**

රජයේ වියදම්වල වැඩිවීම විශාල වශයෙන් ඉක්මවා යමින් ආදායමෙහි වූ තියුණු වැඩිවීම අයවැය හිඟයෙහි විශාලත්වය සැළකිය යුතු අන්දමින් අඩුවීමට හේතු විය. රුපියල් 1,586 කෝටි 20 ලක්ෂයක් වූ අයවැය හිඟය, 1983 වසර සමග සැසඳීමේදී සියයට 27 ක අඩුවීමක් දක්වූ අතර, එය 1982 වසරට වඩා සියයට 21 ක අඩුවීමක් දක්විය. පසුගිය දශකය තුළදී නිරපේක්ෂ වශයෙන් අයවැය හිඟයේ විශාලත්වය අඩුවූයේ මීට පෙර අවස්ථා දෙකකදී (1977 සහ 1981) පමණකි. මුළු වියදමට සාපේක්ෂව අයවැය හිඟය 1983 වසරේදී පැවති සියයට 46 සිට 1984 දී සියයට 30 දක්වා අඩු විය. 1974 වසරෙන් පසු ඇති වූ අඩුම අනුපාතය මෙය විය. ද.දේ.නි. ට සාපේක්ෂව අයවැය හිඟය සියයට 18 සිට සියයට 11 දක්වා අඩු විය.වඩාත් නිවැරදි ආකාරයෙන් අයවැයේ අසමතුලිත තත්ත්වය දක්වන ශුද්ධ මූල්‍ය හිඟය සියයට 18 ක අඩුවීමක් දක්වමින්, රුපියල් 1,363 කෝටි 30 ලක්ෂයක් විය. ද. දේ. නි. යෙහි අනුපාතයක් වශයෙන් ශුද්ධ මූල්‍ය හිඟය සියයට 14 සිට සියයට 9 දක්වා අඩු විය.

වර්තන ගිණුමේ හිඟයක් හෝ සුළු අතිරික්තයක් හෝ පැවති මෑත කාලයේදී මෙන් නොව 1984 දී ප්‍රාග්ධන වියදමෙන් සැළකිය යුතු කොටසක් රාජ්‍ය අංශයේ ඉතිරිකිරීම් මගින් පියවන ලදී. තවද 1977 න් පසු, පළමු වතාවට රුපියල් 196 කෝටි 50 ලක්ෂයක අතිරික්තයක් ඇති කරමින් විදේශීය හා දේශීය මූලයන් දෙකොටසින්ම ලබාගත හැකි වූ සම්පත් මගින් අයවැය හිඟය ඉක්මවා ගියේ ය. මෙය, විශාල වශයෙන් බැංකු ක්‍රමය වෙත ණය ආපසු ගෙවීමෙන් පිළිබිඹු විය.

අයවැය හිඟය පියවීම සඳහා රුපියල් 1,122 කෝටි 60 ලක්ෂයකට සමාන සම්පත් ප්‍රමාණයක් විදේශීය මූලයන්ගෙන් ලබා ගන්නා ලදී. මෙය හිඟයෙන් සියයට 71 ක් වූ අතර, 1983 දී එය සියයට 51 ක් විය. කෙසේ වුවද, ද.දේ.නි. යට සාපේක්ෂව විදේශ මූලයන්ගෙන් ලත් සම්පත් ප්‍රමාණය සියයට 9 සිට සියයට 7 දක්වා පහත වැටුණි. බැංකු අංශය වෙත කරන ලද ණය ආපසු ගෙවීම් රහිතව ගත් කල, දේශීය අංශයෙන් ලබා ගත් මුළු ණය ගැනීම් ප්‍රමාණය සියයට 65 ක අඩුවීමක් දක්වමින් රුපියල් 395 කෝටි 70 ලක්ෂයක් විය. එම නිසා, අයවැය කටයුතු සඳහා දේශීය මූල්‍ය සහ ප්‍රාග්ධන වෙළෙඳ පොළ කෙරෙහි වූ රැඳියාව, ද.දේ.නි. යට සාපේක්ෂව සියයට 9 සිට සියයට 3 දක්වා අඩු විය. මෙම අඩුවීම මගින් ආංශික වශයෙන් පිළිබිඹු වූයේ නිදන් අරමුදල විසින් රුපියල් ණය සඳහා දායකවීම මුළුමනින්ම මෙන් නැවතීමය.

දේශීය බැංකු නොවන වෙළෙඳ පොළ මූලයන්ගෙන් ලබා ගත් ණය ගැනීම් ප්‍රමාණය, රුපියල් ණය මගින් ලබාගත් රුපියල් 434 කෝටි 40 ලක්ෂයකින් සහ භාණ්ඩාගාර බිල්පත් මගින් ලබාගත් රුපියල් 134 කෝටි 10 ලක්ෂයකින් ද සමන්විත විය. බැංකු නොවන වෙළෙඳ

පොළ මූලයන්ගෙන් ලබා ගත් මුළු ණය සඳහා සේවක අර්ථසාධක අරමුදල රුපියල් 315 කෝටි 20 ලක්ෂයක් දායක වූ අතර, ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් රුපියල් 235 කෝටි 20 ලක්ෂයක් ලබා දෙන ලදී. ශේෂය වූ රුපියල් 18 කෝටි 10 ලක්ෂයක් සපයා දෙන ලද්දේ, විවිධ අර්ථ සාධක සහ විශ්‍රාම වැටුප් අරමුදල්වලිනි. රුපියල් 80 ලක්ෂයක මුදලක් නිදන් අරමුදලෙන් ලැබින. ද.දේ.නි. යට ප්‍රතිශතයක් වශයෙන් නිදන් අරමුදල් හැර, මෙම මූලයන්ගෙන් ලද සම්පත් ප්‍රමාණය සියයට 3.9 සිට සියයට 3.7 දක්වා අඩු විය.

බැංකු නොවන වෙළෙඳ පොළ නොවන මූලයන්ගෙන් ලබාගත හැකිවූ මුළු සම්පත් ප්‍රමාණය, ඉකුත් වසරේ රුපියල් 238 කෝටි 50 ලක්ෂය සමග සැසඳීමේදී රුපියල් 91 කෝටි 60 ලක්ෂයක් විය. සමස්ත අයවැය හිඟය පියවීමේදී මෙම මූලයෙහි කොටස මේ නිසා සියයට 11 ක සිට සියයට 6 ක් දක්වා අඩු විය. වෙළෙඳ පොළ නොවන මූලයන්ගෙන් ගත් ණයවලට විවිධ වර්ගයේ භාණ්ඩාගාර තැන්පතු උපයෝජනයට ගැනීම් ද ඇතුළත් විය. පරිපාලන ණය ගැනීම් යටතේ ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් 17 කෝටි 60 ලක්ෂයක් විය.


දේශීය බැංකු නොවන මූලයන්ගෙන් සහ විදේශීය මූලයන්ගෙන් ලබාගත් සම්පත්වලින් අය වැය හිඟය රුපියල් 196 කෝටි 50 ලක්ෂයකින් ඉක්මවිය. කෙසේ වුවද, කල් පිරුණු රුපියල් ණය ආපසු ගෙවීම් රහිතව බැංකු අංශය වෙත වූ මුළු ණය ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් 264 කෝටි 40 ලක්ෂයක් විය. කල් පිරුණු රුපියල් ණය වෙනුවෙන් රුපියල් 11 කෝටි 70 ලක්ෂයක මුදලක් ආපසු ගෙවන ලදී. බැංකු අංශය වෙත මෙවැනි ප්‍රමාණයක ආපසු ගෙවීම් සිදු කල හැකි වූයේ රුපියල් 67 කෝටි 90 ලක්ෂයක මුදල් ශේෂයන් ද උපයෝජනය කර ගනිමින්ය. මේ අනුව අය වැය කටයුතුවලින් මුදල් සැපයුම කෙරේ 1984 දී රුපියල් 208 කෝටි 20 ලක්ෂයක හෙවත් ද.දේ.නි. යෙන් සියයට 1.4 ට ආසන්න ප්‍රමාණයක සංකෝචනාත්මක බලපෑමක් ඇති කිරීමට යෙදුනි. 1983 දී මීට ප්‍රතිවිරුද්ධ වශයෙන් ද.දේ.නි. යෙන් සියයට 0.4 ට ආසන්න ප්‍රමාණයක ප්‍රසාරණාත්මක බලපෑමක් ඇතිවිය.

**රාජ්‍ය ණය**

1984 වසර අවසානයේදී නොපියවන ලද දළ රාජ්‍ය ණය ප්‍රමාණය 1983 වසරට වඩා සියයට 8 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් රුපියල් 10,591 කෝටි 80 ලක්ෂයක් විය. පසුගිය දශක දෙක තුළදී අඩුම වාර්ෂික වැඩිවීමක් වාර්තා කළ වසර මෙය වේ. අඩු වේගයකින් රාජ්‍ය ණය වර්ධනය වීමට හේතු වූයේ දේශීය ණයවල සුළු අඩුවීම (ආසන්න වශයෙන් සියයට 0.2 කින් පමණ) සහ 1983 වසරට වඩා සැළකිය යුතු ප්‍රමාණයක අඩු අනුපාතයකින් එනම් සියයට 17 කින් විදේශීය ණය වැඩිවීමත්ය. රාජ්‍ය මූල්‍ය කටයුතුවල සමස්ත තත්ත්වයේ ඇතිවූ ප්‍රගතිය පෙන්නුම් කරමින් දේශීය ණයවලින් රුපියල් 254 කෝටියක භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් වසර තුළදී සම්පූර්ණයෙන් ම ආපසු ගෙවා නිම කරන ලදී. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1984 වසරේදී රුපියල් ණයවල නව නිකුත් කිරීම් 1983 මට්ටමට වඩා අඩකින් පමණ අඩුවීමය. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1984 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් ණය ආපසු ගෙවීම සඳහා නිදන් අරමුදලට දායක වීම අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස රුපියල් ණය සඳහා නිදන් අරමුදලේ දායකවීම මුළුමණින්ම පාහේ නතර වීමය.

1984 වසර අවසානයේදී නොපියවන ලද මුළු දේශීය ණය ප්‍රමාණය රුපියල් 5,223 කෝටි 70 ලක්ෂයක් වූ අතර, එය මුළු දළ රාජ්‍ය ණයවලින් සියයට 49 ක් විය. විනිමය අනුපාතිකයෙහි වූ වෙනස්වීම නිසා ඇති වූ අතිරේක වගකීම සහිතව විදේශීය ණය ප්‍රමාණය රුපියල් 5,368 කෝටි 10 ලක්ෂයක් විය. ශුද්ධ රාජ්‍ය ණය (නිදන් අරමුදල අඩු කළ පසු රාජ්‍ය ණය) සියයට 11 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් 9,574 කෝටි 10 ලක්ෂයක් විය. ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් වශයෙන් මුළු රාජ්‍ය ණය 1983 දී පැවති සියයට 81 සිට 1984 දී සියයට 70 දක්වා පහත වැටුණි. විදේශීය ණය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 38 සිට සියයට 35 දක්වා පහත වැටුණු අතර, දේශීය ණය සියයට 43 සිට සියයට 34 දක්වා පහත වැටුණි. ශුද්ධ රාජ්‍ය ණය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 71 සිට සියයට 63 දක්වා පහත වැටුණි.

## රාජ්‍ය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

* දළ රාජ්‍ය ණය වලින් නිදන් අරමුදල් අඩුකළ පසු.

1983 වසරේදී වාර්තාගත වූ සියයට 30 ක වැඩිවීම සමග සසඳන විට සියයට 11 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රාජ්‍ය ණය මත මුළු පොළී ගෙවීම් ප්‍රමාණය රුපියල් 729 කෝටි 60 ලක්ෂයක් විය. විදේශීය ණය මත පොළී ගෙවීම් සියයට 17 කින් වැඩිවූ අතර, දේශීය ණය වර්ධනයෙහි අඩුවීමක් තිබියදී ද දේශීය ණය මත පොළී ගෙවීම් සියයට 9 කින් වැඩි විය. දේශීය ණය මත පොළී ගෙවීම් වැඩිවීමට හේතු වූයේ 1983 වසරේදී නිකුත් කරන ලද රුපියල් ණය සම්බන්ධව 1984 ඇතිවූ නව වගකීම් හේතුකොටගෙනය. දේශීය ණය සඳහා පොළී ගෙවීම්වල සාමාන්‍ය පොළී අනුපාතිකය සියයට 11.6 සිට 1984 දී සියයට 11.1 දක්වා අඩු වූ අතර, විදේශීය ණය මත එම අනුපාතිකය සියයට 3.7 සිට සියයට 3.2 දක්වා අඩුවිය. 1984 දී මුළු ණය සේවාකරණ ගෙවීම් (පොළී වගකීම් සහ ණය ආපසු ගෙවීම්) ඉකුත් වසරට වඩා සියයට 18 ක අඩුවීමක් වාර්තා කරමින් රුපියල් 952 කෝටි 50 ලක්ෂයක් විය. මෙම අඩුවීමට හේතු වූයේ රුපියල් ණය ආපසු ගෙවීම සඳහා නිදන් අරමුදලට කරන ලද රජයේ දායකවීම් නවතා දැමීම නිසා වියදම් මට්ටමෙහි අඩුවීමක් ඇතිවීමය. මෙම අඩුවීමත් 1984 වසර තුළදී ආදායමේ කැපී පෙනෙන සුළු ප්‍රගතියක් හේතුකොටගෙන මුළු ණය සේවාකරණ ගෙවීම් රජයේ ආදායමෙහි කොටසක් වශයෙන් ගත් කල සියයට 46 සිට සියයට 25 දක්වා පහත වැටුණි. ද.දේ.නි. ට සාපේක්ෂව පොළී ගෙවීම් ප්‍රමාණය සියයට 5.4 සිට සියයට 4.8 දක්වා පහත වැටුණි.

1984 වසර අවසානයේදී පැවති මුළු දේශීය ණය සමන්විත වූයේ රුපියල් 3,332 කෝටි 40 ලක්ෂයක් දිගු හා මැදි කාලීන ණයවලින් හා රුපියල් 1,891 කෝටි 30 ලක්ෂයක් ද වූ කෙටි කාලීන ණය වලිනි. දිගු හා මැදි කාලීන ණය 1983 වසරට වඩා සියයට 4 කින් වැඩි වූ අතර කෙටි කාලීන ණය සියයට 6 කින් අඩු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මුළු දේශීය ණයෙහි දිගු හා මැදි කාලීන ණයවල ප්‍රමාණය සියයට 61 සිට සියයට 64 දක්වා වැඩිවූ අතර කෙටි කාලීන ණයවල එම ප්‍රමාණය සියයට 39 සිට සියයට 36 දක්වා අඩු විය. 1984 අවසානයේදී නොපිය වූ දේශීය ණයෙහි සංයුතිය පසුගිය වසරේ සංසන්දනාත්මක දත්තයන් ද සමග 1.43 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**1 . 43 සංඛ්‍යා සටහන**

**නොපියවූ දේශීය ණය**


රුපියල් දශ ලක්ෂ

| කාණ්ඩය | | 1983 | 1984 | වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| අ. මැදි හා දිගු කාලීන ණය | .. .. | 32,150·2 | 33,323·8 | 3·7 |
| එයින්: | | | | |
| රුපියල් ණය | .. .. | 31,953·6 | 33,227·4 | 4·0 |
| පරිපාලන ණය ගැනීම් | .. .. | 196·5 | 96·4 | – 50·9 |
| ආ. කෙටි කාලීන ණය | .. .. | 20,204·4 | 18,913·1 | – 6·4 |
| භාණ්ඩාගාර බිල්පත් | .. .. | 17,400·0 | 14,860·0 | – 14·6 |
| බදු සංචිත සහතික පත් | .. .. | 9·9 | 9·6 | – 3·0 |
| මහ බැංකු අත්තිකාරම් | .. .. | 2,794·5 | 4,043·5 | 44·7 |
| එකතුව | .. .. | 52,354·6 | 52,236·9 | – 0·2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මැදි හා දිගු කාලීන මුළු දේශීය ණයවලින් ආසන්න වශයෙන් සියයට 99 ක් වූ රුපියල් ණය ප්‍රමාණය 1984 දී සියයට 4 කින් වැඩි විය. ඉකුත් වසරේදී එම වැඩිවීම සියයට 24 ක් විය. වසර තුළදී නිකුත් කරන ලද රුපියල් සුරැකුම්පත්වල මුළු වටිනාකම රුපියල් 434 කෝටි 40 ලක්ෂයක් වූයේ රුපියල් 355 කෝටියක මුල් අයවැය ඇස්තමේන්තු ඉක්මවමිනි. 1983 දී මුළු රුපියල් සුරැකුම්පත් නිකුත් කිරීම් රුපියල් 818 කෝටි 80 ලක්ෂයක් විය. 1984 දී රුපියල් ණය සඳහා ප්‍රධාන දායකයන් වූයේ සේවක අර්ථ සාධක අරමුදල (සේ.අ.අ.) සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (ජා.ඉ.බැ.) යි.

## දේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

* දළ දේශීය ණයවලින් නිදහ් අරමුදල් අඩු කළ පසු.

පසුගිය වසරට වඩා සියයට 34 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1984 දී රුපියල් ණය සඳහා සේවක අර්ථ සාධක අරමුදලෙහි දායකවීම රුපියල් 315 කෝටි 20 ලක්ෂයක් විය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සාමාජික දායකත්වයන් සහ ආයෝජන ආදායම් වෙතින් ලද අතිරේක සම්පත් ප්‍රමාණයයි. 1984 දී සාමාජික දායක මුදල් ලැබීම් සියයට 32 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් 158 කෝටි 30 ලක්ෂයක් වූ අතර, ආයෝජන ආදායම් සියයට 29 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් 119 කෝටි 40 ලක්ෂයක් විය. කල් පිරුණු ආයෝජනයන් මත ආපසු ලැබුණු රුපියල් 124 කෝටි 50 ලක්ෂයක්ද සේ.අ.අ. සතුව පැවතුණි. රුපියල් සුරකුම්පත්වල කරන ලද ආයෝජනයන්ට අමතරව සේ.අ.අ. විසින් නාගරික සංවර්ධන අධිකාරියෙහි ණයකරවල රුපියල් 15 කෝටියක් සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ණයකරවල රුපියල් 12 කෝටියක්ද ආයෝජනය කර ඇත.


පසුගිය වසරට වඩා සියයට 55 ක අඩුවීමක් පෙන්නුම් කරමින් 1984 දී රුපියල් ණය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි දායකවීම රුපියල් 103 කෝටි 10 ලක්ෂයක් විය. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු ආයෝජනය කළ හැකි සම්පත් භාණ්ඩාගාර බිල්පත් වැනි කෙටිකාලීන වත්කම් වෙත යොමු කරවීමය. ජා.ඉ.බැ. විසින් 1984 වසර අවසානයට භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් 132 කෝටි 10 ලක්ෂයක් විය. මේ අයුරින් ජා.ඉ.බැ. වෙතින් රජයට ලබා ගත හැකි වූ සම්පත් ප්‍රමාණය 1983 වසරට වඩා සියයට 2 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් 235 කෝටි 20 ලක්ෂයක් විය. 1984 දී රුපියල් ණය සඳහා වෙනත් මූලයන්ගෙන් ලද දායකත්වය රුපියල් 16 කෝටි 10 ලක්ෂයක් විය. එයින් රුපියල් 15 කෝටි 30 ලක්ෂයක් නොයෙකුත් විශ්‍රාම වැටුප් හා අර්ථ සාධක අරමුදල් වෙතින් ලැබුණි. රුපියල් 80 ලක්ෂයක මුදලක් නිදන් අරමුදල් විසින් ජාතික නිවාස නිදන් අරමුදල වෙනුවෙන් දායක විය.

වසර තුළදී රජය විසින් 1984 අගෝස්තු මස සිට බලපැවැත්වෙන පරිදි රුපියල් සුරකුම්පත් නිකුත් කිරීම් හා අදාළ කොන්දේසිවල සංශෝධනයක් කරන ලදී. රුපියල් සුරකුම්පත් සඳහා වාර්ෂික පොළී අනුපාතිකය සියයට 14 සිට සියයට 16 දක්වා වැඩි කළ අතර, කල් පිරීමේ කාලය අවුරුදු 5 සිට අවුරුදු 6 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව 1984 මුල් හත් මස තුළදී පස් අවුරුදු කල්පිරීමේ කාලසීමාවකින් යුතු වාර්ෂික පොළිය සියයට 14 ක් වූ රුපියල් 250 කෝටියක වටිනාකමින් යුත් රුපියල් සුරකුම්පත් නිකුත් කරන ලද අතර, ඉතිරි මාස පහ තුළදී හය අවුරුදු කල් පිරීමේ කාලසීමාවකින් යුතු වාර්ෂික පොළිය සියයට 16 ක් වූ රුපියල් 184 කෝටි 40 ලක්ෂයක් වටිනා සුරකුම්පත් නිකුත් කරන ලදී. වසර තුළදී කල් පිරුණු රුපියල් ණය 22 ක් වෙනුවෙන් ණය ආපසු ගෙවීම් ප්‍රමාණය 1984 දී රුපියල් 307 කෝටි 10 ලක්ෂයක් විය. රජය විසින් කරන ලද ඍජු ණය ආපසු ගෙවීම් රුපියල් 66 කෝටි 70 ලක්ෂයක් වූ අතර, ඉතිරිය නිදන් අරමුදල සතුව පැවති සම්පත් වෙතින් පියවන ලදී.

ඉකුත් වසරේ රුපියල් 8 කෝටියක ශුද්ධ ලැබීමක් සමඟ සසඳන විට වසර තුළදී භාණ්ඩාගාර බිල්පත්වලින් රුපියල් 254 කෝටියක් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන ලදී. ඒ අනුව, 1984 වසර අවසානයේදී නොපියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් 1,486 කෝටියක් විය. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සඳහා වූ සීමාව රුපියල් 2,300 කෝටියක් ලෙස නොවෙනස්ව පැවතුණි. 1983 වසර අවසානයේදී සියයට 12 ක් ව පැවති භාණ්ඩාගාර බිල්පත් වාර්ෂික පොළී අනුපාතිකය ජූනි සහ ජූලි මාසවලදී සියයට 15 දක්වා වැඩි වූ අතර, පසුව සියයට 14 දක්වා පහත වැටුණි.

මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය යටතේ මහ බැංකුව විසින් රජයට දෙන ලද තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය 1984 දී රුපියල් 124 කෝටි 90 ලක්ෂයකින් වැඩි වූ අතර, ඉකුත් වසරේ වූ වැඩිවීම රුපියල් 37 කෝටි 70 ලක්ෂයක් විය. 1984 අවසානයේදී මහ බැංකු අත්තිකාරම් මත නොපියවූ රජයේ ණය වගකීම් ප්‍රමාණය රුපියල් 404 කෝටි 30 ලක්ෂයක් විය.

# විදේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

විශේෂ ණය වශයෙන් 1980 දී ලබාගත් රුපියල් 30 කෝටි 80 ලක්ෂයක් සහ 1983 දී ලබාගත් රුපියල් 27 කෝටි 70 ලක්ෂයක් ද එහි ඇතුළත්ය. වසර තුළ දී දළ පරිපාලන ණය ගැනීම් ප්‍රමාණය රුපියල් 40 ලක්ෂයක් වූ අතර ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් 9 කෝටි 60 ලක්ෂයක් විය.

ඉකුත් වසරේ වූ සියයට 33 ක වැඩිවීම සමග සසඳන කල සියයට 17 ක වැඩිවීමක් වාර්තා කරමින් 1984 වසර අවසානයේදී නොපියවූ මුළු විදේශීය ණය ප්‍රමාණය රුපියල් 5,368 කෝටි 10 ලක්ෂයක් විය. 1984 දී විනිමය අනුපාතිකයන්ගේ උච්චාවචනයන් නිසා නොපියවූ විදේශීය ණය වගකීම් රුපියල් 32 කෝටි 40 ලක්ෂයකින් වැඩි විය.

1.44 සංඛ්‍යා සටහනෙන් දැක්වෙන අයුරු, 1984 දී විදේශීය ණය මත මුළු ලැබීම් ප්‍රමාණය රුපියල් 883 කෝටි 80 ලක්ෂයක් විය. ඉකුත් වසරේදී එය රුපියල් 736 කෝටි 40 ලක්ෂයක් විය. යූරෝ මුදල් ණයවල අවසාන කොටස වශයෙන් ලබාගත් රුපියල් 88 කෝටියක මුදල 1984 අය වැය කටයුතු සඳහා උපයෝගීකොට ගෙන නොමැත.

**1.44 සංඛ්‍යා සටහන**

**විදේශීය ණය සඳහා ප්‍රධාන මූලයන් — 1984**

රුපියල් දශ ලක්ෂ

| මූලයන් | ව්‍යාපෘති ණය | භාණ්ඩ ණය | වෙනත් ණය | එකතුව |
|---|---|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව .. .. | 875·5 | — | — | 875·5 |
| කැනඩාව .. .. | 260·6 | — | — | 260·6 |
| යුරෝ මුදල් .. .. | — | — | 880·3 | 880·3 |
| ප්‍රංශය .. .. .. | 146·4 | 73·1 | — | 219·5 |
| ජර්මන් පෙඩරල් ජනරජය .. .. | 783·0 | 89·3 | — | 872·3 |
| ජාත්‍යන්තර සංවර්ධන සංගමය .. .. | 2,034·1 | — | — | 2,034·1 |
| ජපානය .. .. .. | 608·5 | 255·6 | — | 864·1 |
| මැනුපැක්චර්ස් හැනෝවර්ට්‍රස්ට් සමාගම .. | 415·6 | — | — | 415·6 |
| සෞදි අරාබියානු අරමුදල .. .. | 195·4 | — | — | 195·4 |
| ස්කැන්ඩිනේවිස්කා එන්ස්කිල්ඩා බැන්කන්ස් - ස්වීඩනය .. | 295·0 | — | — | 295·0 |
| ඇමරිකා එක්සත් ජනපදය .. .. | 870·7 | 667·3 | — | 1,538·0 |
| වෙනත් .. .. .. | 292·3 | 95·1 | — | 387·4 |
| දළ ලැබීම් එකතුව .. .. | 6,777·1 | 1,180·4 | 880·3 | 8,837·8 |
| අඩු: ආපසු ගෙවීම් .. .. | 276·5 | 551·0 | 637·8 | 1,465·3 |
| ශුද්ධ ලැබීම් .. .. | 6,500·6 | 629·4 | 242·5 | 7,372·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1984 දී රාජ්‍ය ණය මත පොළී ගෙවීම් සමන්විත වූයේ රුපියල් 580 කෝටි 30 ලක්ෂයක දේශීය ණය මත පොළී ගෙවීම්වලින් සහ රුපියල් 149 කෝටි 30 ලක්ෂයක විදේශීය ණය මත පොළී ගෙවීම්වලින්ය. 1983 දී දේශීය ණය මත පොළී ගෙවීම්වල වැඩිවීම වූ සියයට 27 සමග සසඳන කල වසර තුළදී එම ගෙවීම් සියයට 9 කින් ඉහළ නැඟුණි. ඉකුත් වසරේ සියයට 40 ක වැඩිවීම සමග සසඳන විට විදේශීය ණය මත පොළී ගෙවීම් සියයට 17 කින් ඉහළ නැඟුණි. දේශීය ණය මත පොළී ගෙවීම් සමන්විත වූයේ රුපියල් ණය සඳහා වූ රුපියල් 389 කෝටි 20 ලක්ෂයකින්, භාණ්ඩාගාර බිල්පත් මත වූ රුපියල් 190 කෝටි 80 ලක්ෂයකින් සහ විදේශීය පරිපාලන ණය මත වූ රුපියල් 30 ලක්ෂයකින්ය. ව්‍යාපෘති ණය සඳහා රුපියල් 43 කෝටි 30 ලක්ෂයකින්ද, භාණ්ඩ ණය සඳහා රුපියල් 49 කෝටියකින්ද, වෙනත් ණය සඳහා රුපියල් 57 කෝටියකින්ද විදේශීය ණය මත පොළී ගෙවීම් සමන්විත විය. වෙනත් ණය යටතේ දැක්වෙන යූරෝ මුදල් වෙළෙඳ ණය සඳහා මුළු පොළී ගෙවීම් ප්‍රමාණය 1983 දී රුපියල් 49 කෝටි 70 ලක්ෂයක් වූ අතර, වසර තුළදී එය රුපියල් 51 කෝටි 40 ලක්ෂයක් විය.